**8 ශ්‍රේණිය - නර්තනය**

## පාඩම : පතුරු හා සවරං නැටුම් හඳුනා ගැනීම හා නර්තන නිර්මාණය

**( නිපු. අං. 1.3 )**

## <u>පතුරු නැටුම</u>

- මෙය **විනෝදාස්වාදය** අරමුණු කර ගත් ගැමි නැටුමකි.
- අඟල් **15ක් 18 ක්** පමණ දිග **පතුර** නම් රංග උපකරණය මෙහිදී භාවිතා කෙරේ.
- පතුරු නර්තනයේ දී භාවිතා කරනු ලබන කවි **පතුරු කවි** ලෙස හැඳින්වේ.
- පතුරු ගායනාවල ජන ඇදහිලි හා විශ්වාස පිළිබඳ තොරතුරු අන්තර්ගත වී තිබේ.
- පතුරෙන් ශරීරයේ විවිධ ස්ථාන වලට තට්ටු කිරීමෙන්, හඬ උපදවමින්, අලංකාර ලෙස නර්තනයේ යෙදේ.
- කාන්තා හා පිරිමි යන දෙපාර්ශවයටම නර්තනය සඳහා උචිත ගැමි නැටුමකි.



**පතුරු නැටුම් දැකිය හැකි අවස්ථා**

- පෙරහැර වලදී
- විවිධ ප්‍රසංග වලදී

**පතුරු කවියක්**

සූරිය කුල ඇති හිරු දෙවියන්නේ
පැවිය අණසක ලොව පවතින්නේ
කාරිය කරවා පහදා දෙන්නේ
පතුරු නැටීමට අවසර දෙන්නේ

පැවරුම

1) පතුරු නර්තනය සඳහා භාවිතා කරනු ලබන රංග උපකරණය හඳුන්වන නම කුමක්ද?
.......................................................................................................................
2) සාමාන්‍යයෙන් පතුරක දිග ප්‍රමාණය කොපමණද?
.......................................................................................................................
3) පතුරු නැටුමේ දී භාවිතා කරනු ලබන කවි හඳුන්වන්නේ කුමන නමකින්ද?
.......................................................................................................................
4) පතුරු කවි වල ගැමි ජනතාවගේ කුමන කරුණක් පිළිබඳව සඳහන් වේද?
.......................................................................................................................
5) පතුරු නැටුම දැකිය හැකි අවස්ථා මොනවාද?
.......................................................................................................................
6) ඔබ උගත් පතුරු කවියක් ලියන්න .
.......................................................................................................................
7) පතුරු නැටුම වඩාත් උචිත වන්නේ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයෙන් කුමන පාර්ශවයට ද?
.......................................................................................................................
8) පතුරු නැටුමේ රූප සොයා අලවන්න.
9) ඔබ ඉගෙනගත් පතුරු කවියකට අලංකාර මාත්‍රා දෙකක් නිර්මාණය කරන්න.

# සවරං නැටුම

- **විනෝදාස්වාදය** අරමුණු කරගත් ගැමි නැටුමකි.
- සවරං නැටුමේ දී **සවරම** නම් උපකරණය රංග භාණ්ඩය ලෙස භාවිතා කරනු ලැබේ.
- අඟල් **18ක්** පමණ දිග ලී කැබලි දෙකක දෙකොණට රැලි එල්ලා සවරම සකසනු ලැබේ.
- **කාන්තා පිරිමි දෙපාර්ශවයම** නර්තනයේ යෙදෙන ගැමි නැටුමකි. නමුත් ලාස්‍ය ලක්ෂණ වැඩි වශයෙන් දක්නට ලැබේ.
- සවරං නැටුමේ දී යොදා ගනු ලබන කවි **සවරං කවි** ලෙස හඳුන්වනු ලැබේ.
- සවරම චලනය වන පරිදි අලංකාර මාත්‍රා භාවිතා කරන බැවින් විචිත්‍ර වූ ගැමි නැටුමකි.

**සවරං නැටුම දැකිය හැකි අවස්ථා**

- **පෙරහැර වලදී**
- **විවිධප්‍රසංග වලදී**



**සවරං කවියක්**

දැතට ගන්නේ සවරං පවන් සලන්නේ
සරඹ පාන්නේ පා පොඩි දෙක හසුරන්නේ
ගීත කියන්නේ සුමිහිරි තාල වයන්නේ
සබයට එන්නේ සවරං නැටුම් නටන්නේ

**පැවරුම**

1) සවරං නැටුමේ දී භාවිතා කරනු ලබන රංග උපකරණය හඳුන්වන ලබන නම කුමක්ද?
..........................................................................................................................
2) සවරං නැටුමේ දී භාවිතා කරනු ලබන ගායනා හඳුන්වන්නේ කුමන නමකින්ද?
..........................................................................................................................
3) සවරං නැටුම වඩාත් උචිත වන්නේ කාන්තා පිරිමි යන දෙපාර්ශවයෙන් කවර පාර්ශවයටද?
..........................................................................................................................
4) සවරං නැටුම් දැකිය හැකි අවස්ථා මොනවාද?
..........................................................................................................................
5) ඔබ උගත් සවරං කවියක් ලියන්න .
..........................................................................................................................
6) සවරං නැටුමේ රූප සොයා අලවන්න.
7) ඔබ ඉගෙනගත් සවරම් කවියකට අලංකාර මාත්‍රා දෙකක් නිර්මාණය කරන්න.
8) සවරං යුගලයක් නිර්මාණය කරන්න.

සැකසුම :

රවිඳු පලිහවඩන

නර්තන විෂය ආචාර්ය

හලා / වෙන් / මැල්ලව කණිෂ්ඨ විද්‍යාලය